# මාධ්‍ය නිවේදනයයි

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ කොළඹ හිල්ටන් ආයතනය එක්ව මාධ්‍ය සාමූහිකයක්/සමාජයක් ආරම්භ කිරීමට තීරණය කර ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ගරු සභාපති කුමාර් නඩේසන් හා කොළඹ හිල්ටන් ආයතනයේ සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී මනේෂ් ප්‍රනාන්දු මහත්වරු දෙපළ ඒ පිළිබඳ මූලික එකගතා ගිවිසුමක් පසුගිය සතියේ දී අත්සන් කළහ.

ඒ අනුව, කොළඹ හිල්ටන් හෝටල් ආයතනය විසින් මෙම මාධ්‍ය සාමූහිකයේ/සමාජයේ ක්‍රියාකාරකම් සඳහා සත්කාරක දායකත්වය සපයනු ලබයි. එමගින් මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැලී සිටින දේශීය හා ජාත්‍යන්තර අත්දැකීම් සහිත ජනමාධ්‍ය වෘත්තිකයන්ගේ සහභාගීත්වය සහිතව මාධ්‍ය ක්ෂ්ත්‍රය හා සම්බන්ධ දේශීය අන්තර්ජාතික වැදගත්කමකින් යුතු මාතෘකා පිළිබඳව සාකච්ඡාවට ගැනීමට බලාපොරොත්තු වේ.

පුවත්පත් ප්‍රකාශකයින්ගේ සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය, දෙමළ මාධ්‍ය සන්ධානය හා දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංගමයේ ශ්‍රී ලංකා පාර්ශවය හවුල්කාරීත්වය දරණ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය යටතේ මෙම මාධ්‍ය සමාජය ක්‍රියාත්මක වේ.